542

19 FEB 2018

මාගේ අංකය 030/3/7
නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය,
රිදිබැඳිඇළ ව්‍යාපාරය,
නිකවැරටිය.
2018.01.11

රිදීබැඳි ඇළ ව්‍යාපාරයේ
ව්‍යාපාර කමිටුවේ සියළු කමිටු සාමාජිකයින් වෙත

ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම - රිදීබැඳිඇළ මහා වාරි ව්‍යාපාරය
ව්‍යපාර කළමණාකරණ කමිටුව - 2018 ජනවාරි
දිනය හා වේලාව - 2018.01.11 පෙ.ව.9.30
ස්ථානය - ව්‍යාපාර කළමණාකරණ කාර්යාලය
සහභාගිත්වය - 38

| අනු අංකය | නම | තනතුර/ආයතනය |
|---|---|---|
| 01. | ආර්.එම් රාජරත්න | නේවාසික ව්‍යාපාර කළමණකරු - රිදිබැඳිඇල |
| 02. | ජේ.එම්.ඒ.එස් කරුණාරත්න | ඉංජිනේරු සහකාර - ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 03. | ආර්.එම් සන්ධ්‍යා කුමාරි | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 04. | ඩබ්ලිව්.එම්.ඩී.ඩබ්ලිව් මැණිකේ | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 05. | ආර්.එම්.එන්.කේ රස්නායක | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 06. | පී.පී.ඩී.කේ වීරසිංහ | සංවර්ධන නිළධාරි - නේවාසික ව්‍යාපාර කර්යාලය - රිදිබැඳිඇල |
| 07. | ජේ.එම්.එස්.පී.කේ ජයසුන්දර | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය ලේකම් කාර්යාලය - නිකවැරටිය |
| 08. | ටි.එම්.එම්.ආර් බණ්ඩාරනායක | කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර |
| 09. | ඩබ්ලිව්.එම් සිරිවමල | ජලපාලක - ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 10. | එච්.එම් නිශාන්ති හේරත් | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 11. | ඊ.එම්.යු ජයවර්ධන | ගොවිජන සංවර්ධන නිළධාරි-- නිකවැරටිය |
| 12. | එම්.ඒ.එන්.පී රණසිංහ | කෘෂිකර්ම උපදේශක - නිකවැරටිය |
| 13. | ඊ.එම්.එස්.පී එදිරිසිංහ | සහකාර ප්‍රාදේශිය කළමණකරු(වී අලවි මණ්ඩලය) |
| 14. | ජේ.එම්.ආර් ජයසුන්දර | සහකාර අධ්‍යක්‍ෂ බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය |
| 15. | ඩී.එම්.ජේ.එස් ජයරුවන් | ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරි |
| 16. | ඩබ්ලිව්.එම් ජයසූරිය | වාරිමාර්ග කාර්යාලය - නිකවැරටිය |
| 17. | අයි.එම්.එන්.එස්.කේ ප්‍රේමසිංහ | සංවර්ධන සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 18. | ආර්.ඩී.එච් රන්දෙනිවෙල | සංවර්ධන නිළධාරි- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 19. | එච්.එම්.ආර් වත්සලා | සංවර්ධන සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 20. | ඒ.වි අමරසේකර | ඉංජිනේරු සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 21. | එම්.එම්.එස්.එස් බණ්ඩාර | ඉංජිනේරු සහකාර- ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය |
| 22. | එල්.එච් කපුරුබණ්ඩා | ගරු සභාපති - ඕ/දිවුල්ලැව ගොවිසංවිධානය |
| 23. | ඊ.එම් ගුණතිලක | ගරු සභාපති - බුදුමුත්තාව ගොවිසංවිධානය |
| 24. | කේ.එම් චන්ද්‍රසේන | ගරු ලේකම් - බුදුමුත්තාව ගොවිසංවිධානය |
| 25. | ඒ.එම් ලලිතසිංහ | ගරු සභාපති - කටගමුව ගොවිසංවිධානය |
| 26. | පී.එන් ජයකොඩි | ගරු සභාපති - බලගොල්ලාගම ගොවිසංවිධානය |
| 27. | එච්.එම් රත්නතිලක හේරත් | ගරු ලේකම් - හීලෝගම ගොවිසංවිධානය |
| 28. | ඒ.එම් පියදාස | ගරු ලේකම් - දණ්ඩුවාව ගොවිසංවිධානය |
| 29. | ටී.එම්.ඩි බණ්ඩාර | ගරු සභාපති |
| 30. | එස්.එන්.එම් රංබණ්ඩා | ගරු භාණ්ඩාගාරික - හීලෝගම ගොවිසංවිධානය |
| | ඊ.එම් තිලකරත්න | ගරු භාණ්ඩාගාරික - ඉබ්බාවල ගොවිසංවිධානය |
| 32. | ජේ.ඒ නිහාල් ජයකොඩි | ගරු උපලේකම් - තරණගොල්ල ගොවිසංවිධානය |
| 33. | ටි.එම්.පි තෙන්නකෝන් | ගරු භාණ්ඩාගාරික - මහසෙන් ගොවිසංවිධානය |
| 34. | එච්.එම් මානෙල්හාමි | ගරු භාණ්ඩාගාරික - මාගල්ලේගම ගොවිසංවිධානය |
| 35. | එම්.එම්.කේ මාරසිංහ | ගරු ලේකම් - කැබැල්ලෑව ගොවිසංවිධානය |
| 36. | ඩී.එච් රංජිත් සරත් කුමාර | රියදුරු - නේවාසික ව්‍යාපාර කර්යාලය |
| 37. | ආර්.එම් දිලානි ඉන්දිකා කුමාරි | කාර්යාල කම්කරු - නේවාසික ව්‍යාපාර කර්යාලය |

චාරිත්‍රානුකූලව ආගම සිහිකිරීමෙන් අනතුරුව ව්‍යාපාර කමිටු රැස්වීමට පැමිණි සියලු රාජ්‍ය නිලධාරීන් හා ගොවිසංවිධාන නිලධාරීන් නේවාසික ව්‍යාපාර කළමණාකාරතුමා විසින් පිළිගන්නා ලදි.

අරමුණු පැහැදිලි කිරීම

2017 වර්ෂයට අදාල ආයතන සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමත් 2017 යල කන්නයේ වගා කටයුතු පිළිබඳ සාකච්ඡා කිරීමත් නියමිත බව පෙන්වා දෙනලදි.

ආයතන සංවර්ධන ප්‍රගතිය(වාර්ෂික)

ඉංජිනේරු සහකාර - ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය

මේ වන විට මාගල්ල ජලාශයේ ජල ධාරිතාවය අඩි 11 අගල් 08 බවත් එය අක්කර අඩි 3748 බවත් පෙන්වා දෙන ලදි. පසුගිය මස රැස්වමෙහි සාකච්ඡා කළ පරිදි ජලමුර ලබාදෙන බව පෙන්වා දෙන ලදි.

ගරු සභාපති - බලගොල්ලාගම ගොවිසංවිධානය

කඩිගාව ප්‍රදේශයේ කුඹුරු සඳහා ජලය ලබාදෙන්නේද යන්න විමසා සිටින ලදි.

ඉංජිනේරු සහකාර - ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය - නිකවැරටිය

වර්ෂාව අඩු නිසා මාගල්ල ජලාශයට වැඩි ජල ප්‍රමාණයක් නොලැබුණු හෙයින් කඩිගාව ප්‍රදේශයට ජලය ලබානොදෙන බව සඳහන් කරනලදි.

ගරු ලේකම් - හිලෝගම ගොවිසංවිධානය

ප්‍රධාන ඇලේ කංකුං වැවී ඇති බවත් වැඩිජල ප්‍රමාණයක් ඇලේ නිකුත් කළ පසු පිටාරගලන බව සඳහන් කරනලදී.

ගරු සභාපති - බුදුමුත්තාව ගොවිසංවිධානය

හාතිගම්මන ප්‍රදේශයෙන් දකුණු මහඇල තුළ රොන්මඩ ඇතිනිසා ජලය නොබසින බව ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති - බලගොල්ලාගම /මැද ඇල ගොවිසංවිධානය

කෘෂි පාරවල් සඳහා බොරළු දමා සකස් කිරීම සම්බන්ධයෙන් වාරිමාර්ග ඉංජිනේරුතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට ස්තූති කරන ලදි.

කෘෂිකර්ම උපදේශක - නිකවැරටිය

පසුගිය වසර තුළ බිත්තර වී නිශ්පාදන විශේෂ වැඩසටහන් සිදුකළ බවත් ලේ දන්දීමේ වැඩසටහනක් සිදුකළ බවත් සඳහන් කරනලදී. ජනවාරි මස 03 වන දින දුඹුරු පැල කීඩෑවගේ හානිය පිළිබඳ දැණුවත් කිරීමේ වැඩසටහනක් සිදුකළ බවත් කොළ හකුලන දළඹුවාගේ හානිය ඇති බවද පෙන්වා දෙන ලදි. අධි සාන්ද්‍ර කෘෂිනාශක වර්ග භාවිතා නොකරන ලෙසත් දැණුවත් කරන ලදි. වගාව සඳහා හිතකර සතුන් විනාශ වන හෙයින් විශාල ලෙස ඇත්නම් පමණක් කෘෂිරසායනික භාවිතා කරන ලෙස දැණුවත් කරනලදී. ගොයම් පැල සහපාට වීමට හේතුව ලෙස බණ්ඩි අවස්ථාවේ පොහොර මදිකම බව පෙන්වා දෙන ලදි. කීඩෑ හානිය වසංගත තත්වයකට පත් නොවූ බවත් පවතින කාලගුණ තත්වය කීඩෑවන්ට හිතකර නිසා ඉක්මනින් පාලනය කරන ලෙසත් ජලය බැඳ තැබීමෙන් පැතිරීම වැඩිවන බවද පෙන්වා දෙනලදි.

නේවාසික ව්‍යාපාර කළමණාකරු

දුඹුරු පැල කීඩෑ හානිය වසංගත තත්වයක් වීමට පෙර දැණුවත් කිරීම් සිදුකළ බව පෙන්වා දෙන ලදි. එසේම ගොවිමහතුන් දැණුවත් කරන ලෙසද දන්වා සිටින ලදි. ලබන යල් කන්නය සඳහා බිත්තර වී සැපයීමේ විශාල වගකීමක් රිදිබැඳිඇල ව්‍යාපාරයට ඇතිනිසා ගුණාත්මක බිත්තර වී සැපයිමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස දන්වා සිටිනලදී.

ගරු ලේකම් - බුදුමුත්තාව ගොවිසංවිධානය

බුදුමුත්තාව ගොවිසංවිධාන බලප්‍රදේශයේ දුඹුරු පැල කීඩෑ හානිය පැතිරෙමින් තිබූ බවත් දැණුවත් කිරීම මහගු පිටිවහලක් වූ බවත් සඳහන් කරනලදි.

සහකාර අධ්‍යක්ෂ - බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශය - නිකවැරටිය

බීජ මිල වෙනස් වී නොමැති බවත් පසුගිය කන්නයේ ගත් මිලටම මිලදී ගත හැකි බවත් දන්වාසිටින ලදි. එක යායකට බීජ වී වගාකිරීම තුළ රෝග පාලනය කිරීම පහසු බවත් කන්න රැස්වීමට පෙර ගොවීන් දැණුවත් කිරීමට අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදි. බිත්තර වී වගා කිරීම සඳහා දිවුල්ලෑගොඩ ගොවිජන සේවා බලප්‍රදේශයෙන් සහයෝගය ලැබුණු බවත් ඒ සම්බන්ධයෙන් ස්තූතිය එලකරන ලදි.

ගොවිජනසේවා ප්‍රාදේශිය නිළධාරි - නිකවැරටිය

දෙවන අදියරේ සහනාධාර පොහොර මුදල් මේවන විට ලබාදී ඇති බවත් තුන්වන හා හතරවන අදියරේ අයදුම්පත් අදාල ආයතන වලට යොමුකර ඇති බවත් පෙන්වා දෙන ලදි. ලැබුණු මුදල් වල අඩුපාඩු ඇත්නම් විමසන ලෙසත් දන්වා සිටින ලදි. පොහොරවල යම් හිගයක් පවතින බවත් ගොවිජනසේවා මධ්‍යස්ථානය තුළ මේ බව විට පොහොර ඇති බවත් සෑම ගොවිමහතෙකුටම ලබාදිය යුතු බැවින් එක් ගොවියෙකුට 1000kg බැගින් ලබාදෙන බවද පෙන්වා දෙනලදී. 50kg ක් රු.2500 මිළකට ලබාගත හැකි බවද 2018 අයවැය යෝජනා අනුව වගා රක්ෂණය පිළිබඳ දැණුවත් කිරීම කන්න රැස්වීමේදි සිදුවූ බවත් ඒ අනුව ගොවිමහතෙකුගේ 20% දායකත්වයක් ලබාදිය යුතු අතර 80% ක දායකත්වයක් රජයෙන් ලැබෙන බවත් පැහැදිලි කරන ලදි. ඒ අනුව අක්කරයට රු.40000 මුදලක් ගං වතුර, නියගය හා වන අලි හානි වෙනුවෙන් වගා හානි ගෙවනු ලබන බවත් දෙසැම්බර් 31 දිනෙන් වගා රක්ෂණ කටයුතු අවසන් වූ බවත් පෙන්වා දෙන ලදි.

ගරු ලේකම් - දණ්ඩුවාව ගොවිසංවිධානය

කුඩා ඔය යටි කැළය ඉවත් කිරීම සඳහා දිගින් දිගටම ඉල්ලීම් කළඅතර මේවන විට එහි මිණුම් කටයුතු සිදුකරන බවත් ඒ සම්බන්ධයෙන් කටයුතු කළ සියළුම රාජ්‍ය ආයතන වලට ස්තූති කරන ලදී. බයෝපිල්ම් ආදර්ශන මෙම කන්නයේ සිදුකරන බවත් ගොවින්ට මේ පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා ජාතික මූලය අධ්‍යපන ආයතනයට රැගෙන ගොස් උපදෙස් ලබා දෙනලෙස ඉල්ලා සිටිනලදී.

ගම්මිරිස් අස්වනු අලවි කිරීම සඳහා සම්බන්ධීකරණ වෙළඳපලක් සකස්කර දෙනලෙස ඉල්ලා සිටින ලදී. මේ වන විට රිදිබැඳිඇල ගොවිජන විදහන සමාගම අක්‍රිය වි ඇතිබවත් කොටස් හිමියන් මේ පිළිබඳව ප්‍රශ්න කරන බවත් මේ සම්බන්ධයෙන් යම් ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසත් ඉල්ලා සිටින ලදී.

නේවාසික ව්‍යාපෘති කළමණාකරු

රිදිබැඳිඇල ගොවිජන විදහන සමාගම සමාගම් රෙජිස්ටාර් යටතේ ක්‍රියාත්මකවන ආයතනයක් බවත් ාම් සම්බන්ධයෙන් රැස්වීම් ගණනාවකදී ඉල්ලීම් කළනිසා අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුදෙනා සහ වාරිමාර්ග කළමණාකරන අංශයේ අධ්‍යක්ෂ තුමිය සමග සාකච්ඡාවක් 2018 ජනවාරි 23 දින පැවැත්වීමට නියමිත බව පෙන්වා දෙන ලදී.

ගරු සභාපති - ඒකාබද්ධ ගොවිසංවිධානය

අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුදෙනා දැණුවත් කළද ඔවුන් රැස්වීම් වලට සහභාගි නොවන බවද පෙන්වා දෙන ලදී.

සහයෝගය ලබාදුන් සියළුම රාජ්‍ය නිලධාරින්ට හා ගොවිසංවිධාන නිලධාරින්ට ස්තූතිය ප්‍රකාශ කරමින් ව්‍යාපාර කළමණාකරණ කමටු රැස්වීම නිමා කරන ලදි.

ආර්.එම්. රාජරත්න
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදීබැඳි ඇල ව්‍යාපාරය

2018 ජනවාරි මස ව්‍යාපාර කමිටු වාර්තාවේ ඇමුණුම්

## ආයතන සංවර්ධන ප්‍රගතිය - 2017

| | කාර්යය | ගොවිසංවිධානය | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | බලගොල්ලාගම | බුදුමුත්තාව | කැබැල්ලෑව | හිලෝගම | දිවුල්ලෑව | දණ්ඩුවාව | තරණගොල්ල | මැදඇල | ඉබ්බාවල | මාගල්ලේගම | කටගමුව | හල්මිල්ලෑව | ඕතොට දිවුල්ලෑව | කිරිදිගල්ල |
| 1 | කමිටු රැස්වීම් පැවැත්වීම | 09 | 12 | 12 | 12 | 12 | 11 | 12 | 12 | 11 | 10 | 09 | 10 | 12 | 10 |
| 2 | මහ සභා පැවැත්වීම | 02 | 03 | 02 | 02 | 02 | 02 | 02 | 01 | 01 | 01 | 02 | 02 | 02 | 02 |
| 3 | නිළවරණ පැවැත්වීම | 01 | 01 | | 01 | 01 | | | 01 | 01 | 01 | | | 01 | 01 |
| 4 | මාසික මුදල් සාරාංශ ලැබීම | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 | 12 |
| 5 | බාහිර ගිණුම් විගණනය | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 6 | අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාව | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 7 | ඇලවෙලි නඩත්තුව සඳහා ගිය වියදම් | 385000 | 285755 | 157000 | 182370 | 270000 | 217145 | 299000 | 161400 | 169000 | 196250 | 218900 | | | |
| 8 | ප්‍රදර්ශන පුවරු සවි කිරීම | | | | 01 | 02 | | 01 | | | | 01 | | | |
| 9 | ශ්‍රමදාන පැවැත්වීම මිනිස් දින | 194 | 200 | 269 | 42 | 227 | 296 | 185 | 190 | 31 | 176 | 35 | 35 | | |
| 10 | පොත්පත් ලේඛන සැකසීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ |
| 11 | සංස්කෘතික වැඩසටහන් | 01 | 02 | 01 | 02 | 01 | 03 | 01 | | 01 | 01 | 01 | 01 | 01 | |
| 12 | ගොවිසංවිධාන අරමුදල | 775429.52 | 420160.07 | 525229.48 | 831903.20 | 1875474.13 | 1380689.00 | 1004262.00 | 394642.87 | 744006.00 | 683113.96 | 1017678.00 | 156167.00 | 165596.00 | 298062.00 |
| 13 | අරමුදල් වර්ධනය රු. | 192128 | 253168 | 214959 | 307388 | 278334 | 732178 | 575196 | 44964 | 28000 | -5697 | 285014 | 27999 | 4930 | -3084 |
| 14 | අරමුදල් වර්ධන ප්‍රතිශතය | 24.77% | 60% | 40.92% | 36.09% | 14.84% | 53% | 57% | 11.39% | 37.63% | -0.83% | 71.09% | 17.09% | -3% | -1% |
| 15 | නිරන්තර නඩත්තු සැලසුම් යථාවත් කිරීම | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | ✓ | | |
| 16 | කෘෂි මාර්ග නඩත්තුව දිග මීටර් | 5850M | 16344M | 7000M | | 1500M | 3000M | 700M | 8672M | 1300M | 6820M | | | | |

ආර්.එම්. රාජරත්න
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදීබැඳි ඇල ව්‍යාපාරය

# විශේෂ වැඩසටහන්

| වැඩසටහන් | ගොවිසංවිධානය |
|---|---|
| ලෝක ජලදින වැඩසටහන | මාර්තු 22. වීදි නාට්‍යක් මගින් සියුන් දානුවත් කිරීම හා පුස්තකාල පොත්පත් පරිත්‍යාග කිරීම.ගොවිසංවිධාන දැණුවත් කිරීම.පිරිස - 182 |
| මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | මහසභා හා පුහුණුවල දැනුවත් කිරීම.(මැදඇල,බුදුමුත්තාව,කිරිඳිගල්ල) පිරිස - 359 |
| පරිසර වැඩසටහන | ඔසුපැල 225 රෝපනය කිරීම.තරණගොල්ල D 32 ඇල |
| ණය වැඩසටහන<br>(මුළු වටිනාකම රු.2945000 | ගොවිසංවිධාන අරමුදලින්, හිලෝගම 18දෙනෙකු සඳහා 180000.00, ඉබ්බාවල ගොවිසංවිධානයේ ගොවීන් 28 දෙනෙකු සඳහා 280000.00 දිවුල්ලැව ගොවිසංවිධානයේ ගොවීන් 65 දෙනෙකු සඳහා 650000,කටගමුව ගොවිසංවිධානයේ ගොවීන් 18 දෙනෙකු සඳහා 180000, දණ්ඩුවාව ගොවිසංවිධානයේ ගොවීන් 110දෙනෙකු සඳහා 1010000. තරණගොල්ල ගොවිසංවිධානයේ ගොවීන් 75 දෙනෙකු සඳහා 750000 වගා ණය ලබාදෙන ලදී. |
| පුහුණු හා දැණුවත් කිරීම් | මූල්‍ය කළමණාකරණ පුහුණුවක් පැවැත්වීම. , ගොවිනායකයින් නායකත්ව පුහුණු වැඩසටහනට සහභාගි කරවීම. , කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් බෝග සායන වැඩසටහන් 02 පැවැත්වීම. |
| ටී.ජේ.සී. අඹ වගා වැඩසටහන | කිරිදිගල්ල ගොවිසංවිධානයේ ගොවීන් 50 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම. |
| සංස්කෘතික වැඩසටහන් | අනුරාධපුර ජයශ්‍රීමහ බෝධිය අභියස වාරිමාර්ග කළමණාකරණ අංශය මගින් සිදුකරන ලද වැසිපිරිත් පිංකම සඳහා ගොවීන් 55 දෙනෙකු සහභාගි කරවීම. හිලොගම ගොවිසංවිධානය මගින් අනුරාධපුර ජයශ්‍රීමහ බෝධියට කිරි ආහාර පූජාවක් පැවැත්වීම., දළදා මාලිගාවෙහි පවත්වන ලද, යල් අස්වනු පූජාව සඳහා ගොවීන් සහභාගි කරවීම. , මාගල්ල ජලාශයේ කිරි ඉතුරුම් මංගලයක් පැවැත්වීම. |
| කාන්තා අනු කමිටු පිහිටුවීම | කාන්තා අනු කමිටු 05 ක් පිහිටුවීම. කාන්තා කමිටු සාමාජිකාවන් සඳහා බීජ කට්ටල 100 ක් බෙදාදීම. කාන්තා අනු කමිටු සාමාජිකාවන් 91 දෙනෙකු ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාවක් සඳහා සහභාගි කරවීම. , මැදඇල, ඉබ්බාවල, හිලෝගම , දණ්ඩුවාව, තරණගොල්ල, ගොවිසංවිධාන නියෝජිතයින් 45 දෙනෙකු දෙදින ක්ෂේත්‍ර අධ්‍යන චාරිකාවක් සඳහා සහභාගි කරවීම. |
| ගො.සං. කාර්යාල පවත්වාගෙන යාම | වාරිපුබුදු පසු උවටැන් වැඩසටහන යටතේ ඉදිකරන ලද ගොවිසංවිධාන කාර්යාල ගොඩනැගිලි විවෘත කිරීම. (දණ්ඩුවාව, දිවුල්ලැව, කැබිල්ලැව, බුදුමුත්තාව) |
| පරිසර වැඩසටහන් | කෘෂි රසායනික හිස් භාජන දැමීම සඳහා ගොවිසංවිධාන 14 සඳහා බහාලුම් 50 බෙදාදීම හිස් භාජන එක්ගස් කිරීම හා එම අපද්‍රව්‍ය දඹුල්ල ගොවිපලට භාරදීම. |

ආර්.එම්. රාජරත්න
නේවාසික ව්‍යාපාර කළමනාකරු
රිදීබැඳි ඇල ව්‍යාපාරය

R.M. RAJARATHNA
RESIDENT PROJECT MANAGER
RESIDENT PROJECT MANAGER OFFICE
MILLAGODA
NIKAWERATIYA.